දැන්වීමයි

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 (MN1) III ශ්‍රේණිය තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2016

1.0 අංක 52 හා 2013.07.26 දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආදායම් පරීක්ෂක තනතුරට අදාළ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි විධිවිධානයන්ට අනුකූලව සහ අංක 249 හා 2015.01.19 දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධානයන්ට අනුකූලව, දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 III ශ්‍රේණිය තනතුරු සඳහා පුරප්පාඩුව පවතින පහත දක්වා ඇති තනතුරුවලට බඳවා ගැනීම සඳහා මතු සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් මෙම කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2017.01.03 දින වන අතර, මෙම විභාගය 2017 ජනවාරි මස පැවැත්වේ.

සංකේත අක්ෂරය	**තනතුර**
A	ආදායම් පරීක්ෂක සේවය
B	ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථාන භාරකරු
C	සහායක මැනුම් උපදේශක
D	පරීක්ෂණාගාර සහායක
E	වෙළඳ පොළ පරිපාලක

2.0 දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙළ අනුව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් බඳවා ගැනීම සිදු කෙරේ. බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේ දී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව,පහත පරිදි බඳවා ගන්නා අතර, බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය.

3.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ.කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ල ම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

4.0 වැටුප : අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 III ශ්‍රේණිය MN 1- 2016 වන අතර, මාසික වැටුප් පරිමාණය 27,140/- 300x10-350x11-495x10-660x10-45,540/- වේ. එම චක්‍ර ලේඛනයේ උපලේඛන II අනුව 2016.01.01 දින සිට 2016.12.31 දින දක්වා අදාළ වනුයේ රු.15,924/- මූලික වැටුපක් හා රු.9,914/- ක ගැලපුම් දීමනාවකි.

5.0 මෙම තනතුර ස්ථිරය.

6.0 **සුදුසුකම්** :-

I. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

II. මනා ශාරීරික හා මානසික යෝග්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

III. පදිංචිය සනාථ කිරීම

දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු අතර, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක් අයදුම් කරනු ලබන දිස්ත්‍රික්කය තුළ පදිංචිය සනාථ කළ යුතුය. පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකය අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර, නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතු ය.

IV. මෙම අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම ඒ ඒ තනතුරුවලට අදාළව පහත සඳහන් අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

(අ). සිංහල/ දෙමළ, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

(ආ). අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ) සහායක මැනුම් උපදේශක තනතුර සඳහා මාස 06කට නොඅඩු මැනුම් පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම.

7.0 **වයස** :-

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

8.0 **මාධ්‍ය** :-

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍ය තුනෙන්ම පැවැත් වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

9.0 **විභාග පරිපාටිය** :-

අපේක්ෂකයන් පහත සඳහන් විෂයයන් ඇතුළත් ලිඛිත විභාගයකට පෙනී සිටිය යුතුය. (රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ)

ආදායම් පරීක්ෂක සේවයේ III ශ්‍රේණිය

විෂයයන්	**උපරිම ලකුණු ප්‍රමාණය**	**සමත් ලකුණු ප්‍රමාණය**	**කාලය**
බුද්ධි පරීක්ෂණය	100	40%	පැය 1
භාෂා හැකියාව	100	40%	පැය 1

1. බුද්ධි පරීක්ෂණය - අපේක්ෂකයා සතු සාමාන්‍ය බුද්ධිය,තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාව හා අවබෝධාත්මක හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි.
2. භාෂා හැකියාව - අක්ෂර වින්‍යාසය, වියරණ භාවිතය, නිරවුල් හා පැහැදිලි අදහස් ප්‍රකාශනය, භාෂාවේ යෙදුම් පිළිබඳ අවබෝධය, සාරාංශකරණය හා රචනාමය හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා අපේක්ෂකයකු විසින් එක් එක් විෂය සඳහා යටත් පිරිසෙයින් සියයට හතළිහක් (40%) අපේක්ෂකයින් විසින් ලබාගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක් (50%) ලබා ගත යුතු වේ.තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු සපුරාලන පරිදි ලබාගත් කුසලතා අනුපිළිවෙළ අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථාන භාරකරු /සහායක මැනුම් උපදේශක / පරීක්ෂණාගාර සහායක / වෙළඳ පොළ පරිපාලක

විෂයයන්	**උපරිම ලකුණු ප්‍රමාණය**	**සමත් ලකුණු ප්‍රමාණය**	**කාලය**
සාමාන්‍ය දැනීම	100	40%	පැය 1
භාෂා හැකියාව (සිංහල / දෙමළ)	100	40%	පැය 1

1. සාමාන්‍ය දැනීම - අපේක්ෂකයා සතු සාමාන්‍ය බුද්ධිය, තර්කන හැකියාව, සංඛ්‍යාත්මක කුසලතාවය හා අවබෝධය මැනීම, කාලීන හා සමාජීය සිදුවීම් පිළිබඳ දැනීම මැන බැලීම පිළිබඳ ප්‍රශ්න පත්‍රයකි.
2. භාෂා හැකියාව (සිංහල / දෙමළ) - අක්ෂර වින්‍යාසය, වියරණ භාවිතය, නිරවුල් හා පැහැදිලි අදහස් ප්‍රකාශනය, භාෂාවේ යෙදුම් පිළිබඳ අවබෝධය, සාරාංශකරණය හා රචනාමය හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා අපේක්ෂකයකු විසින් එක් එක් විෂය සඳහා අවම වශයෙන් ලකුණු 40ක් වත් ලබා ගත යුතු අතර, තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු සපුරාලන පරිදි ලබාගත් කුසලතා අනුපිළිවෙළ අනුව අපේක්ෂකයින් සේවයට බඳවා ගැනීම සඳහා තෝරාගනු ලැබේ.

10.0 **විභාගය පැවැත්වීමට යෝජිත දිස්ත්‍රික්ක** :-

විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට යෝජිත නගරයන් පහත පරිදි වේ. යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වූ විට විභාගය ආසන්නතම නගරයේදී පවත්වනු ඇත.අයදුම්කරුවන්, නගරය ලෙස සඳහන් කළ යුත්තේ අයදුම්කරු ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයේ පහත සඳහන් නගරයක් පමණි.

දිස්ත්‍රික්කය	**විභාග නගරය**
ගාල්ල	ගාල්ල
මාතර	මාතර
හම්බන්තොට	තංගල්ල

11.0 **අයදුම්පත්** :-

(අ) මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව ඒ 4 (සෙ.මී.21x29)ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කළ යුතු ය. අංක 01 සිට 03 දක්වා ශීර්ෂ පළමුවන පිටුවට ද, අංක 04 සිට 12 දක්වා ශීර්ෂ දෙවන පිටුවට ද ඉතිරිය තුන්වන පිටුවටද ඇතුළත් වන පරිදි සකස් කර විට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය.එක් එක් තනතුරු සඳහා වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතුය. අයදුම්පත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **www.psc.sp.gov.lk** මඟින්ද ලබා ගත හැකිය.

(ආ) නිවැරදිව සකස් කරන ලද අයදුම්පත් 2017.01.03 දිනට පෙර, "ලේකම්, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, 06 වන මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, ගාල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙලවරේ "**දකුණු පළාත් රාජ්‍ය සේවයේ ……………… තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2016- ……………… දිස්ත්‍රික්කය**" (ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය දක්වන්න) යනුවෙන් සඳහන් කළ යුතු ය. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.කිසිදු සහතික පත්‍රයක්/ ඡායා පිටපතක්, අයදුම්පත සමඟ අමුණා නොඑවිය යුතුය.

(ඇ). ඉල්ලුම් පත්‍රය සකස් කළ යුත්තේ තම විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙනි.

(ඈ). රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් තම අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

(ඉ). ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති හා ඉල්ලුම්පත්‍ර කැඳවන අවසාන දිනට පසුව මුදල් ගෙවූ කුවිතාන්සි ඇතුළත් අයදුම්පත්, මුදල් ගෙවූ කුවිතාන්සි අලවා නොමැති අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව මෙම කොමිෂන් සභාව විසින් වග කියනු නොලැබේ. ඉල්ලුම්පත් ලද බව හෝ ප්‍රතික්ෂේප කළ බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ.

(ඊ). අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

12.0 **විභාග ගාස්තු** :-

(අ). මෙම විභාගය සඳහා අයදුම්කරන සෑම අයදුම්කරුවෙකු විසින්ම විභාග ගාස්තු ලෙස රු. 400/- ක මුදලක් දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 2003-02-13 දරන අය ශීර්ෂයට බැරවන පරිදි දකුණු පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. අයදුම්කරුගේ නමින් වූ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.මෙම දැන්වීමේ සඳහන් නොවන අයුරින් මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත් සහිත අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, කුමන හේතුවක් නිසාවත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ මාරු කිරීමක් සිදු කරනු නොලැබේ."

13.0 විභාගයට පෙනී සිටීම - අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහා ම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත් නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතු ය. "ඔබ වෙත තබාගත් පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත සහ ඉල්ලුම්පත්‍රය තැපෑලෙන් යොමු කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අයැදිවූ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය සඳහන් කරමින්, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් විමසන ලෙස දක්වන අතර, ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීමට ඔබගේ ෆැක්ස් අංකය ද සමඟ ඉහත ඔබගේ විස්තර ඇතුළත් ඉල්ලීම් ලිපියක් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ෆැක්ස් මඟින් යොමුකරමින් විමසා සිටීමද වඩාත් ප්‍රතිඵලදායී වනු ඇත."

අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ නොසැලකිය යුතු ය. සෑම අපේක්ෂකයකුම විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය.

14.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

II. වලංගු විදේශ ගමන් බලපත්‍රය

15.0. **තෝරා ගැනීමේ ක්‍රමය**

මෙම තනතුරු සඳහා ඉහත 09 ඡේදයේ දක්වා ඇති පරීක්ෂණ වලින් දක්වන ලද කුසලතාවය හා රා.ප.චි.15/90 හි සඳහන් විධිවිධාන හා දිස්ත්‍රික් ජනගහන අනුපාතයට අනුව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයකින් පසුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.(පත්වීම් ප්‍රදානයේදී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්වීම් දිය යුතු අවසාන ප්‍රමුඛතා මට්ටමේ සම ලකුණු ලැබූ අයදුම්කරුවන් කිහිප දෙනෙකු සිටින අවස්ථාවකදී, සම්මුඛ පරීක්ෂණයක් පවත්වා අධ්‍යාපන සුදුසුකම් අනුව ඉහළම සුදුසුකම් ඇති පුද්ගලයන් අනුපිළිවෙලින් තෝරා ගැනේ.)

16.0 **සාවද්‍ය තොරතුරු සැපයීම**

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවාගත් පසුව වුවද, අපේක්ෂකයකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන ඉදිරිපත් කර ඇති බව පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

මෙම නිවේදනයේ සඳහන් නොවන වෙනත් ඕනෑම කරුණක් පිළිබඳව අවසාන තීරණයක් ගැනීම දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේය.

යූ.ජී. විදුර කාරියවසම්
ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2016.11.30 දින,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
6 වන මහල,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
ගාල්ල.

(මෙම දැන්වීම පදනම් කරගෙන විවිධ ආයතන විසින් සාවද්‍ය ලෙස සකස් කර ඉදිරිපත් කරනු ලබන දැන්වීම්වල සඳහන් කරුණු සහිත අයදුම්පත්‍ර කෙරෙහි කිසිදු වගකීමක් දරනු නොලැබේ.)

ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා ☐

තනතුරට අදාළ සංකේත අක්ෂරය
(A/B/C/D/E) ☐ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය ☐

දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ
III ශ්‍රේණියේ ……………………………… තනතුරට බඳවා ගැනීමේ
විවෘත තරඟ විභාගය - 2016

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4) ☐
විභාග නගරය ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
(විභාග නිවේදනයේ 10 වන ඡේදය බලන්න)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ……………………………………
(උදා: GUNAWARDHANA H.M.S.K.)
1.2 සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ……………………………………
(උදා:HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :- ……………………………………
1.4 ජාතික හැඳුනුම්පත් අංකය :- ☐☐☐☐☐☐☐☐☐☐☐☐

2.0 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ……………………………………
2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :- ……………………………………
2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ……………………………………

3.0 3.1 ස්ත්‍රී /පුරුෂ භාවය : ස්ත්‍රී - 1 ☐
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
3.2 උපන් දිනය :- වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐
3.3 2017.01.03 දිනට වයස :- අවුරුදු ☐☐☐☐ මාසය ☐☐ දින ☐☐
3.4 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- ……………………………………
3.5 දුරකථන අංකය ☐☐☐☐☐☐☐☐☐☐

4.0 **අධ්‍යාපන සුදුසුකම්** :-

4.1 **අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර**

	විභාග වර්ෂය			**විභාග අංකය :**	
	විෂයය	**ශ්‍රේණිය**		**විෂයය**	**ශ්‍රේණිය**
1.			6.		
2.			7.		
3.			8.		
4.			9.		
5.			10.		

4.2 **අ.පො.ස. (උසස් පෙළ) විභාගය පිළිබඳ විස්තර** :-

	වර්ෂය හා මාසය			**විභාග අංකය :**	
	විෂයය	**සාමාර්ථය**		**විෂයය**	**සාමාර්ථය**
1.			3.		
2.			4.		

4.3 **උපාධිය පිළිබඳ විස්තර / ලබා ඇති වෘත්තීය සුදුසුකම්** :-

උපාධිය / ඩිප්ලෝමා / වෘත්තීය සහතිකයේ නම	**වලංගු වන දිනය**	**විෂයයන්**	**සාමාර්ථතාව**	**විශ්වවිද්‍යාලය / නිකුත් කළ ආයතනයේ නම**

5.0 වෙනත් සුදුසුකම්:- ……………………………………

6.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුකරනු ලැබ තිබේ ද? (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)
ඔව් ☐ නැත ☐
……………………………………

7.0 **විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර** :-
7.1 විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :- ……………………………………
7.2 ලදුපත් අංකය හා දිනය :- ……………………………………
7.3 ගෙවූ මුදල :- ……………………………………

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගන්න.)

8.0 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවෙකු නම්,
8.1 දෙපාර්තමේන්තුව / ආයතනය :- ……………………………………
8.2 දැනට දරන තනතුර :- ……………………………………
8.3 පත්වීම් දිනය :- ……………දින සිට…………………… දක්වා
8.4 සේවා කාලය :-අවු……………………………………
8.5 ස්ථිර විශ්‍රාම වැටුප් හිමි හෝ තාවකාලික ද යන වග:
(සේවය ස්ථිර කිරීමේ ලිපියේ පිටපතක් අමුණන්න)

9.0 අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම අයදුම් පතේ මා විසින් සපයා ඇති තොරතුරු සියල්ල මාගේ දැනීමේ හා විශ්වාසය අනුව නිවැරදි සහ සත්‍ය බවත්, විභාග ගාස්තුව ගෙවූ …………………… ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක …………………… හා …………………… දින දරන ලදුපත මෙහි අලවා ඇති බවත්, මෙම තනතුරට මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසු හෝ පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම පිළිගනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වෙමි.

……………………………………
දිනය :- …………………… අයදුම්කරුගේ අත්සන

10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත්කරන ……………මහතා/මහත්මිය/මෙනවිය……………මා පෞද්ගලිකව හඳුනන බවත්, ……………වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

……………………………………
දිනය :- …………………… (සහතික කරන්නාගේ අත්සන)
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :-
තනතුර :-
ලිපිනය :- (නිල මුද්‍රාව තබන්න)

(රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළ යුතුය)

11.0 **ආයතන ප්‍රධානියාගේ සහතිකය / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන …………………… මහතා / මිය / මෙනවිය ……………කාර්යාලයේ / ආයතනයේ ……………දින සිට …………………… තනතුරෙහි සේවය කරන බවද, ඔහුගේ / ඇයගේ සේවය සතුටුදායක වන බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිබවද / කළ නොහැකි බවද ඇය / ඔහු මෙතෙක් කිසිම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බවද ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

දිනය:-…………………… ……………………………………
ආයතන ප්‍රධානියා / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

ආයතන ප්‍රධානියා / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම:-
තනතුර:-
ලිපිනය:-
(නිල මුද්‍රාව තබන්න)